- **වසම පිළිබඳ හැඳින්වීම**

කෘෂිකර්මය ජීවනෝපාය කරගත් පිරිසක් වෙසෙන මෙම ග්‍රාමය බස්නාහිර පළාතට අයත් කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත මැතිවරණ බල ප්‍රදේශය තුළ ඇති වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි ගමකි.

වර්ග කිලෝමීටර 15 ක පමණ ප්‍රදේශයක විහිදී පවතින පවුල් 310 ක් පමණ ජීවත්වන මෙම ප්‍රදේශය වූ කලී එක් එක් පවුලකට එක හා සමාන වූ ඉඩම් ප්‍රමාණයක් හිමි නොවේ. එයට හේතුව වන්නේ මෙම ග්‍රාමය අර්ධ නාගරික ප්‍රදේශයක් ලෙස දැකිය හැකි නිසාය. එහෙත් ඉඩම් හිමි පවුල් ද විශාල ප්‍රමාණයක් දක්නට ලැබේ.

මෙහි වෙසෙන ජනතාවගේ විවිධ ජීවනෝපාය මාර්ග ඇත. ප්‍රධාන වගාවන් ලෙස තේ, රබර්, පොල්, එළවළු, කුඹුරු හා නගරබද වෙළඳාම දක්නට ලැබේ.

- **වසමේ සිතියම හා පිහිටීම**

උතුරින් 844 ඊ කටුකැලේ වැල්මීගොඩ වසමින් ද, ඊසාන දිශාවෙන් 843 අයි රණේපුරගොඩ වසමින් ද, නැගෙනහිරින් 850 බී පැලවත්ත නැගෙනහිර වසමින්ද, ගිණිකොනින් 850 ඒ මිරිස්වත්ත වසමින් ද, දකුණින් 850 සී ගොරකදුව වසමින් ද, නිරිත දිගින් 850 ඊ පැලවත්ත බටහිර දකුණ වසමින්ද, බටහිරින් 850 ඩී පැලවත්ත බටහිර උතුර වසමින් ද සමන්විතය.

- **වසමට යන ගමන් මාර්ගය**

කළුතර නගරයේ සිට ගමන්මාර්ගය ගගන්විට කළුතර ගාලුපාරේ කටුකුරුන්ද හන්දියෙන් වමට හැරී මතුගමට පැමිණ, මතුගම අලුත්ගම මාර්ගයේ හොරවල හන්දියෙන් වමට හැරී මිගහතැන්න හරහා පැලවත්තට පැමිණිය හැක.

- **වසමට අයත් ගම් පිළිබඳ තොරතුරු**

  පැලවත්ත, ගොරකදුව, එපිටවල, වෙලේගෙවත්ත, පැලකැටියගොඩ, පැලැල්වැටිය, දමනි ඇල, ගල්කඩුව, මදුරුගොඩැල්ල.

- **වසමේ නම සැදුනු ආකාරය**

  මෙම ගම්මානයේ මිනිරන් පතල් තිබී ඇත. ඒවායේ වැඩ කිරීමට මිනිසුන් කණ්ඩායමක් පාරු මගින් ගඟ තරණය කර පැමිණ පැල තවානක් ලඟ ගොඩබැස ඇත. එම නිසා පැලවත්ත යන නම සැදී ඇති බව ජනශ්‍රැතියේ සඳහන් වේ.

- **වසමේ භූමියේ ස්වභාවය**

  කඳු හා තැනිතලා සහිත භූමියකි. පස මැටි හා වැලි පසක් ද ඇත.

- **වසමේ ජනගහන තොරතුරු**

  ජාතීන් අනුව සිංහල ස්ත්‍රී 583 ක්ද පුරුෂ 572 ක්ද. වෙනත් ජාතීන් ස්ත්‍රී 01ක් ද වෙසෙති. ආගම් අනුව බෞද්ධ 583ක්ද පුරුෂ 572ක්ද, ක්‍රිස්තියානි ස්ත්‍රී 01ක් ද වෙසෙති.

- **වෘත්තිකයන්/ ශ්‍රමිකයන්/ විශ්‍රාමිකයන්**

වෘත්තිකයන්	-	ස්ත්‍රී	0
ශ්‍රමිකයන්	-	ස්ත්‍රී	08 පුරුෂ 20
විශ්‍රාමිකයන්	-	ස්ත්‍රී	10 පුරුෂ 31

- **විශේෂ හැකියා සහිත පුද්ගලයන්**

  හෙට්ටිආරච්චිගේ දම්මික අනුරුද්ධ - කරාටේ

  දොන් සිමන් රාලලාගේ කරුණාදාස ගුණවර්ධන
  ගුවන් විදුලියේ A ශ්‍රේණියේ සරල ගායන ශිල්පියෙක් සේම,
  විරිඳු ගායන ශිල්පියෙකි. කලා භූෂණ සම්මානලාභියෙකි.

- **වසමේ උසස් අධ්‍යාපනය ලබන පුද්ගලයින්**

  ෂෙහානි නිසංසලා ඒකනායක
  වරුනි හංසිකා උඩුගම විතානගේ
  නිරාශා නිවන්ති කලංසූරිය

- **විදේශගත පුද්ගලයින් සංඛ්‍යාව**

  රැකියා සඳහා විදේශගත ස්ත්‍රී - 06 පුරුෂ - 10

- **වසමේ විශේෂ තැන්** - කරංගල කන්ද

- **වසමේ ආගමික ස්ථාන** - ශ්‍රී සුදර්ශනාරාමය, පැලවත්ත

- **ලියාපදිංචි නවාතැන** - සැනෝමා උත්සව ශාලාව

- බැංකු - ග්‍රාමීය බැංකුව

- වෛද්‍ය මධ්‍යස්ථාන - 03

- වසමට අනුයුක්ත රජයේ නිලධාරීන්

සමන්ති ජයසූරිය	රණේපුරගොඩ	ප්‍රා.ලේ.කාර්යාලය සංවර්ධන නිළධාරී	0778180831
සඳමාලි හෙට්ටිආරච්චි	පැලවත්ත	ප්‍රා.ලේ.කාර්යාලය ග්‍රාම නිළධාරී	0716090805
ජී.අශෝක ලාල්	කටුදොර	ගොවිජන සේවා දෙ. (කෘ.ප.නි.ස)	0718442073
එස්.ජයසිංහ	මිරිස්වත්ත	සමෘද්ධි බැංකුව (සමෘද්ධි නිලධාරී)	0718450411
දිලානි දිල්රුක්ෂි	වෙදවත්ත	සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය-පවුල් සෞ.නිළධාරිනී	0788304385